මගේ අංකය : JSC/SEC/CIR – L/2023

<u>අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක : **10/2023**</u>

සියලුම අධිකරණ නිලධාරීන් වෙත,

<u>රිදියගම නිවර්තන නිවාසය වෙත නව රුදවියන් භාර දීම සම්බන්ධයෙනි</u>

ශීර්ෂගත කාරණය හා සබැඳිව දකුණු පළාත් ප්‍රධාන ලේකම්, සුමිත් අලහකෝන් මහතා විසින් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත යොමු කරන ලදුව, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්(නීති) පියුමන්ති පීරිස් මහත්මිය විසින් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලද 2023.02.28 දිනැති ලිපියක් පිලිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව එය අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ වෙබ් අඩවියේ පල කොට ඔබගේ අවධානයට ලක් කරන ලෙසට මට නියම කර ඇත.

02. ඒ අනුව එම ලිපිය අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ වෙබ් අඩවියේ පල කොට ඔබගේ අවධානයට ලක් කරමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. එස්. සෝමරත්න

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2023 අප්‍රේල් මස 28 වෙනි දින,

කොළඹ 12,

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

(18) 2675

1st Place Winner
National Productivity
Award 2020

SLSI SYSTEM ISO 9001 CERTIFIED

SLAB ACCREDITED
ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/4/11/02 | ඔබේ අංකය<br>உனது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2023.02. 28 |

ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය,
උපරිමාධිකරණ සංකීර්ණය,
කොළඹ12.

**<u>රිදියගම නිවර්තන නිවාසය වෙත නව රැඳවියන් භාර දීම සම්බන්ධයෙනි.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් දකුණු පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු,ග්‍රාම සංවර්ධන..අමාත්‍යාංශ ලේකම්ගේ අංක දපස/ක්‍රීග්‍රා/1/5/2/3 හා 2023.02.22 දිනැති ලිපිය හා දකුණු පළාත් සමාජ සුභසාධන,පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සමාජ සේවා කොමසාරිස්ගේ අංක දපස/ස.සේ./6/1/14 හා 2023.02.10 දිනැති ලිපිය යන ලිපි හා බැඳේ.

02.ඒ අනුව,දකුණු පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් පාලනය වන ඉහත ආයතනය වෙත මෑත කාලය තුළ දිගින් දිගටම උසාවි හරහා උග්‍ර මානසික රෝගී තත්ත්වයෙන් යුතු රෝගීන් යොමු කළද ඔවුන් රඳවා තැබීමට විශේෂිත ස්ථානයක් එහි නොමැති වීමෙන් ඔවුන් සාමාන්‍ය රැඳවියන් සමඟ එකට රඳවා තැබීම හේතුවෙන් ඔවුන්ගේ කලහකාරී හැසිරීම්වල බලපෑමෙන් සාමාන්‍ය රැඳවියන්ට ශාරීරික හානි සිදුවීමේ දැඩි අවධානමක් පවතින බවත්,එවැනි රෝගීන් හැසිරවීම හා ලබා දිය යුතු විශේෂ ප්‍රතිකාර පිළිබඳව කාර්යය මණ්ඩලයට නිසි දැනුමක් හෝ අවබෝධයක් නොමැති බවත් දන්වා ඇත.

03. එබැවින්, ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනයේ රඳවා සිටින උග්‍ර මානසික රෝගී තත්ත්වයේ පසුවන රෝගීන් හෝ ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනයට ඇතුළත් කළ යුතු මට්ටමේ රෝගීන් රිදියගම නිවර්තන නිවාසයට ඇතුළත් නොකරන ලෙස සියලුම අධිකරණවල ගරු විනිසුරුතුමන්ලා දැනුවත් කරන මෙන් ඉල්ලා ඇත. අදාල ලිපිය අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා මේ සමඟ කාරුණිකව යොමු කරමි.

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත:
ලේකම්,ක්‍රීඩා හා යෞවන කටයුතු, ග්‍රාම සංවර්ධන,...අමාත්‍යාංශය,දකුණු පළාත - කා.දැ.ස


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office 091 4119011 091 2234052
ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"සෞභාග්‍යමත් දකුණු පළාතක්"